# විදේශගත ශ්‍රමිකයන්ට නීති ආධාර ලබාදීම




නීතිඥ ලිලන්ති කුමාරි
නීති ආධාර කොමිෂන් සභාව

# විදේශගත ශ්‍රමිකයන්ට නීති ආධාර ලබාදීම

**නීතිඥ ලිලන්ති කුමාරි**
එල්.එල්.බී (කොළඹ විශ්ව විද්‍යාලය)

**ගරු එස්.එස්.විජේරත්න මහතා**
සභාපති
ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව

**ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව**
නො:129, උසාවි සංකීර්ණය,
කොළඹ 12.

ප්‍රථම මුද්‍රණය 2010

දෙවන මුද්‍රණය 2013

ප්‍රකාශනය

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව,

නො:129, උසාවි සංකීර්ණය,

කොළඹ 12.

| | |
|---|---|
| දුරකථන | : +94 112433618, +94 113137153, +94 113070255 |
| | : +94 112395894, +94 115835329 |
| ෆැක්ස් | : +94 112433618, +94 112395894 |
| විද්‍යුත් තැපෑල | : legalaid@sltnet.lk |
| වෙබ් | : www.lawaid.org |

| | |
|---|---|
| මුද්‍රණය | : ප්‍රින්ටෙක් එස්ටැබ්ලිෂ්මන්ට් පුද්ගලික සමාගම, |
| | 52/1, එක්වත්ත පාර, මිරිහාන, නුගේගොඩ. |
| දුරකථන | : +94 11815 816 |
| විද්‍යුත් තැපෑල | : sales@printec.lk |

## නීති ආධාර කොමිෂන් සභාවේ ගමන් මග...

ජීවිතේ විවිධාකාර වූ අභියෝග හා අත්දැකීම් විඳිමින් තරඟකාරිත්වය පසුපස දිවෙන සමාජ ක්‍රමයක ජීවත් වන අප වඩා යහපත් වූ සාධාරණ වූ යුක්ති ගරුක සමාජයක් පිළිබඳ අපේක්ෂාවෙන් පසුවෙමු. එවන් මනුෂ්‍යත්වයට ගරු කරන යුක්තිය හා සාධාරණය රජයන සමාජයක් තනන්නට නම් නීතියේ රැකවරණය සැමට සමානව හිමිවිය යුතුවා මෙන්ම ඒ පිළිබඳ දැනුවත් භාවයද අත්‍යවශ්‍යයෙන් තිබිය යුතුයැයි හැගේ. එසේ වනුයේ අප අතරට පැමිණෙන දහසකුත් ජනයා අතර මූලික මිනිස් අයිතිවාසිකම් කඩවීම් හා අපරාධමය වරදවල් තුලින් ප්‍රචණ්ඩකාරී ක්‍රියාවලට මෙන්ම විවාහ භාරකත්ව ඉඩම් යනාදී සිවිල් අයිතිවාසිකම් අහිමිවීම් සම්බන්ධව හඩා වැටෙන මිනිසුන් අපට මුණ ගැසී ඇති නිසාවෙනි. එයට හේතුව වනුයේ නීතිය ගැන නොදැනීම සමාවට කරුණක් නොවීම නිසාවෙන් හා නීතිය අධ්‍යයනය කළ යුතු විෂය මාලාවක් ලෙස හඳුනාගෙන නොමැති නිසාවෙනි.

ලංකාවේ උත්තරීතර නීතිය වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් නීතියේ රැකවරණය සැමට සාධාරණව හිමිවිය යුතු වේ. එබැවින් එකී නීතියේ සාධාරණත්වය සැමට ලබාදීම සඳහා ක්‍රියාත්මක වන ප්‍රධාන ආයතනය ලෙස 1978 අංක 27 දරණ පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරනු ලැබූ ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව හඳුන්වා දිය හැක. ස්වාධීන සභාවක් වශයෙන් ක්‍රියාත්මක වන එය සාමාජිකයින් 9 දෙනෙකුගෙන් සමන්විත වන අතර ඉන් 6 දෙනෙකු ශ්‍රී ලංකා නීතිඥ සංගමය මගින් පත් කරනු ලැබේ. මෙම කොමිෂන් සභාවේ සභාපතිතුමා ඇතුළු සාමාජිකයින් තම දායකත්වය ලබාදෙනු ලබන්නේ කිසිදු වැටුපක් ලබා ගැනීමකින් තොරවය. නීති ආධාර කටයුතු සම්බන්ධයෙන්, විටින් විට උපදෙස් ලබාදීම හා නීති ආධාර පනතේ 17 වන වගන්තිය යටතේ අවශ්‍ය උපදෙස් දීම ශ්‍රී

ලංකා නීතිඥ සංගමය මගින් විධායක සභාවට හිමි වී ඇති කාර්යයකි. නීති ආධාර කොමිෂන් සභාව මගින් ප්‍රධාන වශයෙන් සිවිල් වැදෑරුම් සේවාවක් ඉටුකරනු ලැබේ. ප්‍රථමයෙන් නීති ආධාර කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලය හා දිවයින පුරා පිහිටා ඇති නීති ආධාර කොමිෂන් සභා කාර්යාල 60 කට ආසන්න සංඛ්‍යාවක් මගින් නීති උපදෙස් අවශ්‍ය සෑම කෙනෙකුටම ආදායම් සීමාවකින් තොරව සපයයි. ඒ සඳහා ඒ ඒ අධිකරණ බල ප්‍රදේශවල කටයුතු කරන ජ්‍යෙෂ්ඨ නීතිඥවරුන්ගේ සහායද නීති ආධාර කොමිෂන් සභාව ලබාගනු ඇත. නොදැනුවත්කම නිසා නීතිය සම්බන්ධව තීරණ ගැනීමේදී සේවා දායකයන් බොහෝ අවස්ථාවල වැරදි, නීත්‍යානුකූල නොවන තීරණ ගනු ලැබේ. එය වැලැක්වීම මෙම සේවයේ ප්‍රධාන අරමුණයි.

දෙවනුව අධිකරණ මාර්ගයෙන් බාහිරව පෞද්ගලික හෝ බාහිර සමාජයෙන් ඇති වන ගැටළු සම්බන්ධයෙන් අධිකරණ මාර්ගයට යොමු නොවී ප්‍රාථමික මට්ටමින් සමථකරණය තුළ ගැටළු විසදාගැනීමටත් එදිනෙදා ජීවිතයේ බලපාන නීති ගැටළු සඳහා යා යුතු මග පැහැදිලි කරදීමටත් මෙන්ම රාජ්‍ය ආයතන අතර සම්බන්ධීකරණ කටයුතු කිරීමත් එහිදී ජනතාවට අත්‍යවශ්‍ය කාරණා වලදී සහයෝගය ලබාදීමත් නීති ආධාර කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යයන් අතර වේ. ජනතාවට මෙවන් ප්‍රායෝගික නීති දැනුමක් ලබාදීමෙන් සමාජයේ ඇතිවිය හැකි ගැටළු බොහෝමයක් අවම කරගත හැකිවෙයි. එබැවින් නීති ආධාර කොමිෂන් සභාව මගින් මෙකී නීති අධ්‍යාපනය ලබාදීම සඳහා පාසැල් වල මෙන්ම ගම් මට්ටමෙන්ද රාජ්‍ය ආයතන හරහාද කාන්තාවන්, ළමුන් වැඩිහිටියන්, සම්බන්ධව නීති ආධාර වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. එමෙන්ම මාධ්‍ය තුළින්ද නීති දැනුම ලබාදීමට නීති ආධාර කොමිෂන් සභාව කටයුතු කරන අතර ඒ සඳහා ඩේලි නිවුස් පුවත්පතේ (Daily News) සෑම

සිකුරාදාවකමද ලංකාදීප පුවත්පතේ දෙසතියකට වරක් අඟහරුවාදාවකමද තිනකරන් පුවත්පතේ සෑම බදාදාවකම නීති උපදේශන පිටුවක් ප්‍රකාශයට පත් කෙරේ.

තෙවනුව නීති ආධාර කොමිෂන් සභාව නඩුමගට පිවිසෙන රුපියල් 12,000ට අඩු සේවාදායකයින්ට නොමිලේ නීතිඥවරයකුගේ සේවය ලබාදීම නීති ආධාර කොමිෂන් සභාවේ කාර්යයක් වේ. අපරාධ වින්දිතයන් සඳහා නීතිඥ සහය ලබාදීමේ වැඩපිළිවෙලක් ද නීති ආධාර කොමිෂන් සභාවේ නීතිඥයින් විසින් ඉටුකරනු ලැබේ. නීතිඥ සහය සැපයීමේදී විවිධ අධිකරණ ප්‍රදේශවල සේවය කරන නීතිඥවරුන්ගේ සහාය ලබාගන්නා අතර ඒ අයගේ සේවය සඳහා සීමා සහිත ගෙවීමක් ගරු දීමනාවක් වශයෙන් නීති ආධාර කොමිසම මගින් ලබා දෙනු ලැබේ. ඒ අනුව එම නීතිඥවරුන්ට සේවාදායකයින්ගෙන් මුදල් ලබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් වේ.

එමෙන්ම සැමට නීතියේ රැකවරණය සැලසීම සඳහා ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව සංවර්ධනාත්මක නීති ඒකක පිහිටුවා ඇත. ඔබට බලපාන ඕනෑම ගැටළුවකදී නොමිලයේ උපදෙස් ලබාගැනීමට මෙම ඒකකය හරහා හැකියාව ඇත. මෙම ඒකක සඳහා වෙනම නීතිඥවරයෙකු සිටින අතර ප්‍රධාන කාර්යාලයේ දුරකථන අංක 011-2433618 හෝ 011-5335329 ඇමතීමෙන් ඔබට අවශ්‍ය සහය ලබාගත හැක.

## සංවර්ධනාත්මක නීති ආධාර ඒකක

- අල්ලස හා දූෂණ තුරන් කිරීමේ නීති ඒකකය.
- විනිශ්චය කාරවරුන්, නීතිඥයින්, ආධුනික නීතිඥවරුන් පුහුණු කිරීමේ ඒකකය.
- ළමා අයිතිවාසිකම් හා පාසල් වැඩසටහන් නීති ඒකකය.
- පරිභෝගික නීති ඒකකය
- ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිම් සම්බන්ධ නීති ඒකකය.
- මානව හිමිකම් පිළිබඳ නීති ඒකකය.
- වැඩිහිටි නීති ඒකකය
- මානව හිමිකම් සංසදය
- අභ්‍යන්තර අවතැන්වූවන් පිළිබඳ නීති ඒකකය
- විදේශගත ශ්‍රමිකයින් පිළිබඳ නීති එකකය
- කාන්තා අයිතිවාසිකම් සුරැකීමේ නීති ඒකකය
- රාජ්‍ය නිලධාරීන් නීතිය පිළිබඳව දැනුවත් කිරීමේ නීති ඒකකය
- කම්කරු හා කාර්මික ආරවුල් පිළිබඳ නීති ඒකකය
- මනෝ වෛද්‍ය උපදේශන හා නීති ඒකකය
- පරිසරය සුරැකීමේ නීති ඒකකය
-

ඒ අනුව ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව වඩාත් සාධාරණ වූ යුක්ති ගරුක වූත් සමාජයක් බිහි කරන්නට දායකත්වය ලබාදේ. නීතිය නොදැනීම සමාවට කරුණක් නොවේය යන ආප්තෝප්දේශය අනුව යම් ප්‍රමාණයක නීතිය පිළිබඳ දැනුවත් විමක් මහජනතාවට ලබා දෙන නීති ආධාර කොමිෂන් සභාවේ සියලුම දෙනාට මාගේ ස්තුතිය පිරිනමනු කැමැත්තෙමි. ඒ තුලින් යහපත් වූ සාධාරණ සමාජයක් තනන්නට මෙකී නීති දැනුම රුකුලක් වනු ඇතැයි යන්න මගේ පැතුමයි.

එස්.එස්.විජේරත්න<br>
සභාපති<br>
ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව

# පෙරවදන

සමාජයේ කාන්තා ශ්‍රමිකයින් අතර විදේශගතවන ගෘහසේවිකාවන් ඉතා වැදගත් කාර්‍යයභාරයක් ඉටුකරයි. ඔවුන්ගේ ගැටළු සම්බන්ධයෙන් පවත්නා වූ නීතිමය දැනීම සහ අවබෝධය ඉතාමත් දුර්වල මට්ටමක පවතින බව අප කාගේත් හැඟීමයි. විශේෂයෙන් අප නීති ආධාර කොමිෂන් සභාවට ලැබෙන පැමිණිලි අනුව ඒ බව පසක් වේ. එකී අඩුපාඩු මගහරවාලමින් ඔවුන් පිළිබඳව සහ ඔවුන්ට අවශ්‍යය මූලික නීතිමය කරුණු රශියක් පෙලගස්වන්නට මෙම පොත් පිංච මගින් මා අපේක්ෂා කරමි.

මෙම පොත් පිංචය සකස් කිරීම සඳහා මා දිරිමත් කල නීති ආධාර කොමිෂන් සභාවේ සභාපති ගරු එස්.එස්.විජේරත්න මැතිඳුන්, අධ්‍යක්ෂ ජෙනරාල් හෙක්ටර් එස් යාපා මැතිඳුන්, උපදේශිකා නෙලුම් ගමගේ මැතිණිය හා නීති ආධාර කොමිෂන් සභාවේ සියළුම කොමසාරිස්වරුන් ගෞරවයෙන් සිහිපත් කරමි.

එමෙන්ම මෙම පොත් පිංච සකස් කිරීම සඳහා වටිනා අදහස් ලබාදුන් අප කොමිෂන් සභාවේ නියුතු සහෝදර නීතිඥ මඩුල්ල සහ කාර්‍යය මණ්ඩලයට බෙහෙවින් ස්තූතිවන්ත වෙමි.

එමෙන්ම මෙම පොත් පිංච පරිගණකගත කල කළමණාකරන සහකාර කාන්චනා ජයවීර මහත්මියද නිරන්තරයෙන් මෙම පොත සකස් කරන මෙන් මා පසුපස පැමිණ මට මතක් කර දුන් නීතිඥ කළණි මැදගොඩ මෙනවියටද ස්තූතිවන්ත වෙමි.

මෙවැනි කාර්‍යයක් සඳහා මා දිරිමත් කල මාගේ මෑණියන් හා සැමියා බැතියෙන් සිහිපත් කරන අතර මෙම පොත් පිංච මඟින් විදේශගතවන්නාවූ සියලුම ශ්‍රමිකයන්ට නීතිමය අවම කර ගැනීමට මාර්ගෝපදේශයක්ම වේවායැයි හුදෙක්ම මම ප්‍රාර්ථනා කරමි.

ලිලන්ති කුමාරි
නීති නිලධාරි
විදේශගත ශ්‍රමිකයින්ගේ ඒකකය

# විදේශගත ශ්‍රමිකයන්ට නීති ආධාර ලබාදීම

පසුගිය විසි වසරක කාලය තුල මැදපෙරදිග සේවය කරන ශ්‍රමිකයින්ගේ සංඛ්‍යාව දස ගුණයකින් වැඩිවී ඇති අතර මේ වන විට ලක්ෂ 10කට වැඩි සේවක පිරිසක් විදේශ සේවාවන්හී යෙදී සිටිති. ඊට අමතරව සෑම වසරකම ලක්ෂ 2ක පමණ පිරිසක් විදේශගතවන බවද වාර්තාවලින් පෙනී යයි.

ඒ අනුව මෙම කාලය තුල ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සැලකිය යුතු විදේශ විනිමය (මුදල්) ප්‍රමාණයක් ලැබෙන බවත් මහාබැංකුව වාර්තාවලින් පෙන්නුම් කරයි. මේ තොරතුරු අනුව මෙහිදී අප සොයා බැලිය යුතු කාරණා කිහිපයකි.

1. විදේශගතවන ගෘහ සේවිකාව හෝ සේවකයාට රට යෑමට පෙර ලංකාව ඇතුලතදී ලැබෙන ආරක්ෂාව
2. විදේශ රටට ගියපසු විදේශීය රටේ රැකියා නියෝජිත ආයතන(ඒජන්සී)නියෝතයින්ගෙන් නිසි රැකවරණයක් ලැබේද?
3. සේවය කරන හාම්පුතුන්ගේ නිවෙස තුලදී ලැබෙන ආරක්ෂාව
4. සේවය අවසන් වී ලංකාවට පැමිණීමෙන් පසු අදාල රාජ්‍ය ආයතන මගින් නිසි රැකවරණයක් ලැබේද?
5. විවාහක දරුවන් සිටින කාන්තාවන් විදේශගත වූ පසු එම දරුවන්ගේ නිසි රැකවරණය, භාරකාරත්වය පවරන්නේ කාටද?

මෙකී ප්‍රශ්ණයන් රාශියක් හමුවේ මැදපෙරදිගට යන ශ්‍රී ලාංකික සේවකයින්ට එම අභියෝග ජය ගැනීම වෙනුවට තමාගේ සියලු අරමුණු බිඳීගොස් තමාගේ නිවෙස තුල සිටිය අහිංසක දරු පැටවුන්ගේද සිහින කඩාවැටී තිබෙන්නට පුලුවන.

විශේෂයෙන් මැදපෙරදිග ගෘහ සේවය සඳහා පිටව යන පිරිසගෙන් අති බහුතරයක් කාන්තාවන්ය. ඔවුන්ට මෙරටදී මෙන්ම එරටදීද මුහුණදීමට සිදුවන අනේකවිධ දුක් කම්කටොලු එමටය. විදේශ රටේදී තමන් කිසි දිනක දැක නොසිටි ආරාබි ජාතිකයින් මගින් හිංසනයට හා අතවරවලට ලක්වේ.තවද ශ්‍රමය අනවශ්‍ය ලෙස සූරාකෑම, වැටුප් රහිතව දීර්ඝ කාලයක් සේවය කිරීමට සිදුවීම, විවිධ ශල්‍යකර්ම වලට භාජනය කොට ශරීරයේ අවයව වංචනික ලෙස ගලවා ගැනීම සිදුවේ.

මෙරටදී අපේම ශ්‍රී ලාංකිකයන් මගින් විවිධ අතවර වලට ගොදුරු වීම. වංචනික ලෙස සකස් කරන ලේඛනවලට අත්සන් තැබීම වැනි වංචනික කටයුතු වලට පහසුවෙන්ම ගොදුරු කර ගනියි.

මේ ආකාරයෙන් අහිංසක ගෘහ සේවිකාවන් මෙම වංචනික ඒජන්තවරුන්ගේ ජාලයට හසුවීමෙන් ඔවුන්ගේ මුළු අනාගතය පිළිබඳ දුටු සිහිනය බිඳ වැටී යන්නේ ඉතා කෙටි කාලයකදීය. යම් සේවිකාවක් විදේශගත වීමට පෙර සහ විදේශගතවීමට පසු නැවත ලංකාවට පැමිණි පසු යන අවස්ථාවන් 3ට සම්බන්ධ කරගනිමින් ඒ පිළිබඳ අපි කවුරුත් වැඩි වශයෙන් අදාල බලධාරින් සමග නිරන්තර සාකච්ඡා,සම්මන්ත්‍රණ පවත්වා ඒ පිළිබඳ තීරණ තීන්දු ගෙන ක්‍රියාවට නැංවිය යුතුය.

මෙහිදී විදේශ රැකියාවක් සඳහා පිටත්ව යාමට පෙර ඔබට වැදගත් වන්නාවූ ප්‍රධානතම ආයතනයක් වන්නේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයයි, එහි ලිපිනය වන්නේ,
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය,
අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
කොස්වත්ත,
බත්තරමුල්ල.

මෙම ස්ථානයට අවශ්‍යයනම් ලිපියක් මගින් හෝ දුරකථන ඇමතුමක් මගින් ඔබගේ ගැටළුව ඉදිරිපත් කොට අවශ්‍යය තොරතුරු ලබාගත හැකිය. එහි දුරකථන අංකය වන්නේ 0112- 864101-05ය.

වර්ථමාන සමාජයේ ගෘහ සේවිකාවන් විදේශගත කිරීම මිනිස් ජාවාරමකින් කෙලවර වේ. ලෝකය පුරා බලහත්කාරයෙන් වැඩ ගැනීමට හා ලිංගික සුරාකෑමකට ගොදුරු වී සිටින ළමයින්ගේ හා වැඩිහිටියන්ගේ සංඛ්‍යාව මිලියන 12.3 ක් බව ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ වාර්තා අනුව පෙනී යයි.

ශ්‍රී ලාංකිකයන් සේවයේ යෙදී සිටින ඇතැම් මැදපෙරදිග රටවල තිබෙන රැකියා ඒජන්සිවල නියෝජිත කාර්යාල හෝ ශාඛා තිබේ. මෙම කාර්යාලවල රාජකාරී කරන සමහර ශ්‍රී ලාංකිකයන් විසින් මෙම ගෘහ සේවිකාවන්ව සේවයේ යොදවා අනිසි බලපෑම් කිරීම, ලිංගික අපයෝජනය,ශාරීරික වධහිංසා කිරීම,ගණිකා වෘත්තියේ යොදවා වැඩියෙන් මුදල් හම්කරගැනීම ආදී නොයෙකුත් නීති විරෝධී ක්‍රියාවන් වල නිරත වෙති.

විදේශ රැකියා සඳහා පිටත්ව යන සියලු ශ්‍රී ලාංකිකයන් ලියාපදිංචි වී විදේශගතවීම නීතිමය අවශ්‍යතාවයන් බව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත අනුව දක්වා ඇත.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ දත්තයන්ට අනුව ලියාපදිංචි වී විදේශගතවූ සේවකයින්ගේ අලුත්ම සංඛ්‍යා ලේඛණ මෙසේය.

| වසර | | සංඛ්‍යාව |
|---|---|---|
| 1999 | - | 120,627 |
| 2000 | - | 127,615 |
| 2001 | - | 137,467 |
| 2002 | - | 152,974 |
| 2003 | - | 154,693 |
| 2004 | - | 156,146 |
| 2005 | - | 165,707 |
| 2006 | - | 141,177 |
| 2007 | - | 146,515 |

විදේශගත වුවන් ලියාපදිංචි නොවී සෘජු මාර්ගවලින්ද විදේශගතවී ඇති ප්‍රමාණය ඉහල යමින් පවතින බවද විදේශ සේවා නියුක්ති කාර්යාංශ වාර්තාවලින් පෙනී යයි.

**<u>සෘජු මාර්ගවලින් විදේශගත වී ඇති සංඛ්‍යාව</u>**

| **වසර** | - | **සංඛ්‍යාව** |
|---|---|---|
| 1999 | - | 59,108 |
| 2000 | - | 54,573 |
| 2001 | - | 51,540 |
| 2002 | - | 50,799 |
| 2003 | - | 54,110 |

1985 අංක 21 දරණ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත අනුව විදේශ රැකියා සඳහා පිටත්ව යන සියළු ශ්‍රී ලාංකිකයන් ලියාපදිංචි වී විදේශගතවීම නීතිමය අවශ්‍යතාවයකි.

**විදේශගතවීම සම්බන්ධව ඇති නීති ප්‍රතිපාදන**

1) 1985 අංක 21 දරණ ප්‍රධාන පණත

2) 1994 අංක 04 දරණ සංශෝධන පනත

3) 2009 අංක 56 දරණ සංශෝධන පනත

විදේශගත කිරීමේ කාර්යයේ නියැලී සිටින සියළුම රැකියා නියෝජිත ආයතන මෙම පණතේ නීතිමය ප්‍රතිපාදන වලින් බැඳී සිටියි. ප්‍රධාන

පණතේ 62(2) වගන්තිය අනුව බලපත්‍රයක් නොමැතිව විදේශ රැකියා ඒජන්සියක් කරගෙන යාම මේ යටතේ වරදක් බවත්, මහේස්ත්‍රාත් අධිකරණයේ ලඝු නඩු විභාගයකින් පසු දඩ මුදල් නියම කිරීමට මහේස්ත්‍රාත්තුමාට බලයක් ඇත.

**විදේශගතවීම සම්බන්ධව ඇති දේශීය නීති ප්‍රතිපාදන**

1) 1985 අංක 21 දරණ විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත හා ඊට අදාල 1994 අංක 04 දරණ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ (සංශෝධන පනත) ප්‍රධාන පනතේ 62(2) වගන්තිය අනුව බලපත්‍රයක් නොමැතිව විදේශ රැකියා ඒජන්සියක් කරගෙන යාම මේ යටතේ වරදක් බවත්, මහේස්ත්‍රාත් අධිකරණයේ ලඝු නඩු විභාගයකින් පසු පහත ආකාරයේ දඩ නියම කිරීමට මහේස්ත්‍රාත්තුමාට බලයක් ඇත. ප්‍රධාන පනත අනුව අවමය රුපියල් 10,000කට යටත්ව උපරිමය රුපියල් 15,000 නොඉක්මවන සේද ඒසේ නොගෙවන හැම දිනකටම රුපියල් 200කින් අමතර දඩයක්ද ගෙවිය යුතුය. නමුත් මෙම චෝදනාවේ බරපතලභාවය සුළුපටු එකක් නොවේ. මන්ද සංශෝධන පනතේ 7වෙනි වගන්තිය යටතේ ඊට නියම කර ඇති දඩ මුදල් අවමය රුපියල් 20,000ක්ද උපරිම රුපියල් 100,000ක් නොඉක්මවන දඩයකට වරදකරු කරනු ලැබීමෙන්, පසුව ඒ වරද නොකඩවා කරනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් 1,000 අතිරේක දඩයකටද යටත්විය යුතුය.

විදේශගත කිරීමේ කාර්යයේ නියැලී සිටින සියළුම බලයලත් ඒජන්සි ආයතන සියල්ලන්ම මෙම පනතේ නීතිමය ප්‍රතිපාදනවලින් බැඳී සිටියි.

**<u>විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ අඩංගු නීතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වූයේ ඇයි?</u>**

විදේශ තානාපති කාර්යාලවලින් ලැබෙන තොරතුරු හා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත ලැබී ඇති පැමිණිලි අනුව පෙනී ගිය කරුණක් වූයේ මැද පෙරදිග ඇතුළු විදේශ රටවල විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ පා සිටින ශ්‍රී ලාංකිකයන් එම අභාග්‍යසම්පන්න තත්වයට මුහුණ දී ඇත්තේ ව්‍යාජ මාර්ගවලින් විදේශ රැකියා බලාපොරොත්තු වීම හේතුවෙන් බවය. එමනිසා ව්‍යාජ මාර්ගවලින් විදේශ රැකියා සඳහා පිටත්ව යන ශ්‍රී ලාංකිකයින් නීත්‍යානුකූල මාර්ගවලින් යැවීමටත් සෑම අයෙක්ම ලියාපදිංචි කර අවශ්‍ය අවස්ථාවලදී විදේශ රැකියා කරන්නවුන් පිළිබඳව සොයා බැලීමටත් මෙම නීතිය ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පැන නැගුණි. තවද පෞද්ගලික මාර්ගවලින් විදේශගතවන අය කාර්යාංශයේ ලියාපදිංචි වී එතෙර රැකියාවට යාමේදී ලියාපදිංචි ඒජන්සි මාර්ගයෙන් විදේශගතවන අය වෙනුවෙන් ඒජන්සිය දරණ වගකීම කාර්යාංශය මගින් දරනු ලැබේ.

**<u>විදේශගතවීම සම්බන්ධයෙන් ඇති ජාත්‍යන්තර ප්‍රතිපාදන</u>**

1) 1990 එ.ජ ගේ සියළුම විදේශගත ශ්‍රමිකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ වූ ජාත්‍යන්තර සම්මුතිය.

මෙම සම්මුතිය 1990-12-18 වන දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබේ. මෙය සැකසීමේදී මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුති, කාන්තාවන්ගේ හා

ළමයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර සම්මුති, ජාත්‍යන්තර කම්කරු සංවිධානය මුල්වී කම්කරු සුභ සාධානය සඳහා ඇතිකල සම්මුති ආදී මානව සුභ සාධනය පිළිබඳව සම්මුති රැසක් පදනම් කොට ගෙන මෙය ඇති කරගන්නා ලදී.

**<u>සම්මුතියේ දළ සැකැස්ම</u>**

**පූර්විකාව**

1වන කොටස - විෂය ක්ෂේත්‍රය සහ අර්ථ නිරූපනය

2වන කොටස - අයිතිවාසිකම් සම්බන්ධයෙන් වෙනස්කමකට භාජනය නොකිරීම

3වන කොටස - සියළු ශ්‍රමිකයන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ මානව අයිතිවාසිකම්

4වන කොටස - සාමාන්‍ය තත්වය යටතේ සිටින නැතහොත් ප්‍රලේඛනගත ශ්‍රමිකයන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ වෙනත් අයිතිවාසිකම්

5වන කොටස - විශේෂිත කාණ්ඩවල විදේශගත ශ්‍රමිකයන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ අයිතිවාසිකම්

6වන කොටස - ජාත්‍යන්තරව විදේශගතවන ශ්‍රමිකයන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සම්බන්ධව යහපත් සාධාරන මානුෂීය සහ නිත්‍යානුකූල කොන්දේසි ප්‍රවර්ධනය කිරීම.

7වන කොටස - සම්මුතිය අදාල කිරීම

8වන කොටස - සාමාන්‍ය විධිවිධාන

9වන කොටස - අවසාන විධිවිධාන

මෙම සම්මුතියේ ඇති සුවිශේෂිතාවය වන්නේ විදේශීය ශ්‍රමිකයන්ගේ මෙන්ම ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේද අයිතිවාසිකම් සුරක්ෂිත වීමයි. මෙම සම්මුතිය නීත්‍යානුකූලව පිළිගෙන සම්මත කරගැනීමෙන් අනතුරුව මව්බිමේදී මෙන්ම රැකියාව නිසා පදිංචිවීමට නියමිත දේශයේදී ද විදේශගත ශ්‍රමිකයන්ගේ සහ සිය පවුල් සාමාජිකයන්ගේ සමාජ දේශපාලන ආර්ථික හා සංස්කෘතික අයිතීන් සහතික වී ඇත.

මෙමගින් බොහෝ දෙනෙකුට විශ්වාසයකින් යුතුව තම අනාගතය දෙස බැලීමේ අවස්ථාව හා හැකියාව විදේශගතවීම මගින් ලබාදී ඇත. එනම් බොහෝ කාන්තාවන්ට උරුම වී ඇත්තේ දුෂ්කර රැකියා හා ජීවන තත්වයන්,අමානුෂික සැලකීම්, නින්දා අපහාස හා සැහැසිකම්ය. මෙම සමස්ත සංක්‍රමණ ක්‍රියාවලිය අක්‍රමවත්, දූෂිත හා අනාරක්ෂිත තත්වයක් යටතේ පැවැත්විය නොහැකි සේම පැවැත්විය යුතුද නොවේ.

ශ්‍රමිකයන් විදේශගතව සිටියදී ඔවුන්ගේ ආරක්ෂාව ගැන මෙවැනි තත්වයක් පැවැත්විය නොහැකි සේම පැවැත්විය යුතුද නොවේ.
ශ්‍රමිකයන් විදේශගතව සිටියදී ඔවුන්ගේ ආරක්ෂාව ගැන සහතිකවීම මව් රටේ අධිකරණ බලසීමාවන් නිසා සීමිත වී ඇත. ශ්‍රමිකයන්ගේ ශ්‍රමය නොකඩවා ලබාගැනීමත් ඔවුන්ගේ අයිතිවාසිකම් අඛන්ඩව කඩවීමත් නිසා ශ්‍රමිකයන් හා ශ්‍රමය ලබාගන්නා රාජ්‍යයන් හා සේවා යෝජකයන් අතර නිරන්තරයෙන් ගැටුම් ඇතිවේ. ඔවුන් ශ්‍රමිකයන් ගැන දක්වන්නේ අවම උනන්දුවකි. එමෙන්ම ශ්‍රමය ලබාදෙන හා ලබාගන්නා රාජ්‍යයන් අතරද ශ්‍රමිකයන් සම්බන්ධයෙන් සාකච්ඡාවන්ද නැති තරම්ය.
මෙම සම්මුතිය මගින් ශ්‍රමිකයන්ගේ සියළු මානව අයිතින් ඒකරාශි කොට දක්වා ඇත. මෙම ජාත්‍යන්තර සම්මුතියට මේ වන විට අත්සන් තබා පිළිගෙන ඇති රටවල් සමහරක් පහතින් දක්වා ඇත.

1 බොස්නියාව
2 අස්රවයිජානය
3 හසේගොවිනාව
4 කේප්වරේඩ්
5 කොලොම්බියාව
6 ඊජිප්තුව
7 ඝාණාව
8 සිරියාව
9 මෙක්සිකෝව
10 මොරොක්කෝව
11 පිලිපීනය
12 සෙනිගල්
13 සිෂේල්ස් දිවයිනේ
14 ශ්‍රී ලංකාව
15 උගන්ඩාව
16 බංගලාදේශය
17 චිලී
18 කොමරෝස්
19 ගෝතමාලාව
20 ගිණිගාබිසම්
21 පැරගුවේ
22 සැන්තෝමේ
23 ප්‍රින්සිපේ
24 ටජිකස්ථානය
25 තුර්කිය

**සම්මුතියට අනුව විදේශගත ශ්‍රමිකයා හඳුන්වන්නේ**

''තම මව් බිම නොවන දේශයක මුදල් ලබන ක්‍රියාදාමයක නියලෙන්නට සිටින, නියැලී සිටින හෝ නියැලී සිටි පුද්ගලයායි''

- පිටරටවල සේවයෙහි යෙදී සිටින එහෙත් මේ සම්මුතියෙන් ආවරණය නොවන සේවකයන් වන්නේ අන්තර්ජාතික සංවිධාන හා ආයතන මගින් යවනු ලබන හෝ සේවයෙහි යොදවනු ලබන පුද්ගලයන් වේ.
- සම්මුතියේ පරිදි පවුලේ සාමාජිකයන් යනු සහකරු හෝ සහකාරිය විදේශගත ශ්‍රමිකයන්ගෙන් යැපෙන දරුවන් සහ පවුලේ සාමාජිකයන් ලෙස නීතයානුකූලව ප්‍රකාශිත වෙනත් පුද්ගලයන්ය.

සියළු විදේශගත ශ්‍රමිකයන්ගේ අයිතීන් සම්බන්ධව වෙනස්කමකට භාජනය නොවන ලෙස සම්මුතිය සැකසී තිබේද? ඔව්

ලිංගභේදය, ගෝත්‍රය, වර්ණය, භාෂාව, ආගම හෝ විශ්වාසයන් දේශපාලන හෝ වෙනත් නිගමන වර්ගීකත්වය හෝ සමාජ

සම්භවය,ජාතිය,වයස, ආර්ථික තත්වය දේශපාලන හෝ වෙනත් මතිමතාන්තර, දේපල, විවාහක අවිවාහක බව හෝ සමාජ තත්වය ගැන නොසලකා විදේශගත ශ්‍රමිකයන්ට සමාන අයිතීන් භුක්ති වීදීමට හා මානව අයිතීන් සුරක්ෂිත කර ගැනීමට ඉඩකඩ සලසා ඇත.

- විදේශගත ශ්‍රමිකයන්ගේ හා සිය පවුලේ සාමාජිකයන්ගේ මිනිස් අයිතීන් මොනවාද?

  මිනිස් අයිතීන් පිළිබඳව ප්‍රජාතාන්ත්‍රික රාජයයන් විසින් පොදුවේ පිලිගනු ලබන ප්‍රතිපත්ති හා නිදහස අනුව සෙසු ජනතාව භුක්ති විඳින සියළු අයිතීන් සමානත්වයෙන් භුක්ති විඳීමේ අයිතිය සහ මව්බිමෙන් පිටදේශයක ජීවත්වීමේ හා නැවති සිටීමේ අයිතිය හිමිවේ. වද හිංසා නොමිනිස් හෝ නින්දනීය සැළකුම් හෝ දඩුවම් වලින් ආරක්ෂාව.
- වහල් බවෙන් ආරක්ෂාව.
- වරදකරුවන් වී බරපතල දඩුවම් වලට භාජනය වූවන් හැර සෙසු හැම ශ්‍රමිකයෙකුම බලහත්කාරයෙන් සේවයේ යෙදවීමෙන් ආරක්ෂාව.
- සිතීමේ හා ආගමක් ඇදහීමේ නිදහස
- මත දැරීමේ ප්‍රකාශණයේ නිදහස
- පෞද්ගලිකත්වයට ලිපි ලේඛනයට හා සන්නිවේදනයට බලහත්කාරයේ ඇඟිලි ගැසීමෙන් ආරක්ෂාව.
- දේපල අයිතියේ නිදහස
- සැහැසිකම්, කායික වද බන්ධන, තර්ජන හා බියගැන්වීම් වලින් ආරක්ෂාව මෙන්ම පෞද්ගලිකත්වයේ නිදහස හා ආරක්ෂාව ලැබීමේ අයිතිය
- හිංසාවෙන් ආරක්ෂාව

- ප්‍රමාණවත් තොරතුරු ලබාගැනීමේ අයිතිය.
- තම සංස්කෘතික අනන්‍යතාවය හා එහි මූලයන් ආරක්ෂා කර ගැනීමේ අයිතිය.

නීතිය හමුවේ වරදකරුවන් වූ විදේශගත ශ්‍රමිකයන්ට හා සිය පවුල්වල සාමාජිකත්වයට හිමි අයිතීන් වන්නේ වරදකරුවෙකු වූ ශ්‍රමිකයාට හා සිය පවුල් සාමාජිකත්වයටද වරදකරුවෙකු වූ වෙනත් ඕනෑම පුද්ගලයෙකු සතු සියළු අයිතිවාසිකම් හිමිවෙයි. ප්‍රජාතන්ත්‍රවාදය උසස් අන්දමින් ක්‍රියාත්මක වන ශ්‍රමය ලබාගන්නා රාජ්‍යයන් මේ අයිතීන් පිළිගෙන ඇත.

- සෑම අවස්ථාවකදීම නීතිය ඉදිරියේ සිටින පුද්ගලයෙකු සේ සැලකීම.
- ක්‍රමවත් හා කඩිනම් විනිශ්චයක අයිතිය.
- නීතිඥ සහය ලැබීමේ අයිතිය.
- සාධාරණ විනිශ්චයකට ඇති අයිතිය.
- තම මව්බිමේ තානාපති කාර්යාලය හෝ නියෝජිත ආයතන හා සමග සන්නිවේදනයේ හා සහය පැතීමේ අයිතිය.
- භාෂා පරිවර්තකයෙකු නොමිලේ ලබාගැනීමේ අයිතිය.

ශ්‍රමිකයා සිරගත සමයේ සිය සහකරු හෝ සහකාරිය බාලවයස්කාර දරුවන් සහ පවුලේ සාමාජිකයන් රැකබලාගැනීම, අදාල රාජ්‍යයේ වැසියන් සිරගත වූ
විට භුක්ති විඳින්නා වූ සියළු අයිතිවාසිකම් විදේශගත සිරකරුවාටද
හිමිවේ.සිරගතවීම නිසා දුෂ්කරතාවන්ට මුහුණ දෙන ශ්‍රමිකයාගේ පවුලේ සාමාජිකයන් ගැන විශේෂයෙන් සහකරු හෝ සහකාරිය හා බාල දරුවන් ගැන බලධාරීන් සිය අවධානය යොමුකල යුතු වෙයි

සම්මුතියේ පාර්ශව රාජ්‍යන්ගේ භූමිකාව වන්නේ ශ්‍රමය දෙනු ලබන හා ගනු ලබන සම්මුතියේ පාර්ශවය රාජ්‍යයන් ශ්‍රමිකයන්ට සහ සිය පවුලේ සාමාජිකත්වයට ස්ථිර එක හා සමාන ශිෂ්ඨ වටපිටාවක් ලබාදීමට සහයෝගයෙන් ක්‍රියාකල යුතුය. තවද පාර්ශවිය රාජ්‍යයන් ශ්‍රමිකයන්ට යෝග්‍යය සේවාවන් පවත්වාගෙන යායුතුය. ශ්‍රමිකයන්ට හා සිය පවුල් සාමාජිකත්වයට සහයවීම පිණිස තානාපති හෝ නියෝජිත කාර්යාල හා වෙනත් අදාල සේවාවන් පවත්වාගෙන යාමට ඉඩකඩ දිය යුතුය.

ශ්‍රමිකයන්ට හා සිය පවුල් සාමාජිකත්වයට නීත්‍යානුකූල ලෙස ආපසු තම මව්බිමට පැමිණීමට මෙන්ම නැවත පදිංචිවීමටද අවශ්‍ය ආර්ථික පහසුකම් සලසාදීමටද දෙපාර්ශවයේම රාජ්‍යයන් සහයෝගයෙන් ක්‍රියාකල යුතුය.

අ) කොන්ත්‍රාත්තුවේ පරිදි අදාල වගකීම් ඉටු කිරීමට නොහැකිවීම නිසා දඟගෙට යාමෙන් වැලකී සිටීමේ නිදහස

ආ) කොන්ත්‍රාත්තුවේ පරිදි අදාල වගකීම් ඉටු කිරීමට නොහැකිවීම නිසා පදිංචි ස්ථානය හෝ රැකියා බලපත්‍රය අහිමිවීමෙන් බේරී සිටීමේ නිදහස

ඇ) හැඳුනුම්පත හා ගමනට අදාල ලියකියවිලි(ගමන් බලපත්‍ර, විසා,සේවා බලපත්‍ර, කොන්ත්‍රාත් ආදිය) ආරක්ෂාකාරීව හා පරිස්සමින් තබාගැනීමේ අයිතිය.

ඈ) අතිකාල දීමනා, සේවා පැය, සති අන්ත නිවාඩු, වැටුප් නිවාඩු, ආරක්ෂාව, සෞඛ්‍යය, රැකියා අවසන් කිරීමේ සහ සබඳතා ඇතුළු ආගන්තුක රාජ්‍යයෙහි වැසියන් සතු වන්දි ලැබීම්වලට නොඅඩු වන්දි ලබාගැනීමේ අයිතිය.

ඉ) 1) සමාජ රක්ෂණ අයිතිය හා

2) හදිසි වෛද්‍යාධාර ලැබීමේ අයිතිය

ඇතුලත්විය යුතු සේවා කොන්ත්‍රාත්, සමානාත්මතා මූලධර්මයට අනුකූල විය යුතුය.

සම්මුතියේ පාර්ශවය රාජ්‍යයන්ගේ භූමිකාව වන්නේ ශ්‍රමය දෙනු ලබන හා ගනු ලබන සම්මුතියේ පාර්ශවය රාජ්‍යයන් ශ්‍රමිකයන්ට හා සිය පවුලේ සාමාජිකත්වයට ස්ථිර එක හා සමාන ශිෂ්ඨ වටපිටාවක් ලබාදීමට සහයෝගයෙන් ක්‍රියාකල යුතුය.

පාර්ශවීය රාජ්‍යයන් ශ්‍රමිකයන්ට හා සිය පවුලේ සාමාජිකත්වයට වැටහෙන භාෂාවකින් මේ නිවේදනය ඔවුනට යොමු කල යුතුය. කෙසේ වෙතත් අවසන් තීරණය දන්වා එවීමට පෙර, පළවා හැරීමට එරෙහිවීමට හා ඊට හේතු දැක්වීමට ශ්‍රමිකයන්ට අයිතිය ඇත.

පළවා හැරීමේ තීරණය අවලංගු කලහොත් ශ්‍රමිකයන්ට හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්ට නීති ප්‍රකාර වන්දි ලබාගැනීමේ අයිතිය ඇත. පළවා හැරීමකදී ඒ ඒ පුද්ගලයන් සම්බන්ධව වෙන වෙනම සලකා බැලිය යුතුය. ආගන්තුක රාජ්‍යයෙන් පළවා හැරීමකදී තම මව්බිම නොවන වෙනත් රාජ්‍යයකට යාමට ඉල්ලා සිටීමේ අයිතිය ශ්‍රමිකයින්ට හා සිය පවුල් සාමාජිකත්වයට හිමිවෙයි.

පළවා හැරීමකදී පළවා හැරීම හා සම්බන්ධ වියහියදම් ශ්‍රමිකයන් හෝ සිය පවුල් සාමාජිකයින් විසින් දැරිය යුතු නොවේ. එහෙත් ගමන් වියදම් පමණක් දැරීමට සිදුවිය හැක. පළවා හැරීමකදී ශ්‍රමිකයින්ට හා පවුලේ සාමාජිකත්වයට හිමි වැටුප් හා වෙනත් පහසුකම් ලබා ගැනීමේ අයිතිය ඇත.

- එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් දෙසැම්බර් 18 වන දින ජාත්‍යන්තර සංක්‍රමණිකයින්ගේ දිනය ලෙස නම් කොට ඇත.

2006-2008 වසර දක්වා වයස් කාණ්ඩවල ස්ත්‍රී පුරුෂයන්ගේ විදේශ රැකියා සඳහා පිටත්ව ඇති සංඛ්‍යාව.

| වයස් කාණ්ඩය | 2006 | 2007 | 2008 |
|---|---|---|---|
| 19 හා ඊට අඩු | 1228 | 5501 | 1684 |
| 20-24 | 14,729 | 34,348 | 31,534 |
| 25-29 | 45,230 | 45,106 | 55,346 |
| 30-34 | 34,702 | 34,326 | 48,447 |
| 35-39 | 31,687 | 31,806 | 38,947 |
| 40-44 | 26,780 | 26,792 | 34,951 |
| 45-49 | 16,548 | 16,043 | 24,814 |
| 50 හා ඊට වැඩි | 8,023 | 7,711 | 16,272 |
| හඳුනා නොගත් වයස් කාන්ඩ | 8,023 | 16,826 | 26 |

මෙම දත්තයන්ට අනුව අවුරුදු 19ට අඩු පිරිස ද වාර්ෂිකව විදේශ රැකියා සඳහා පිටත්ව යන බවක් පෙනේ. මෙහිදී බොහෝදුරට මොවුන් ව්‍යාජ ලේඛණ සකස් කිරීමෙන් විදේශගත කරන බවද පෙනේ. බොහෝ අවස්ථාවන්හි විදේශගතවලදී නීතියේ රැහැනට හසුවූ අය අතර බාලවයස්කාර සේවකයින්ද සිටියි.

**<u>රක්ෂණය</u>**

විදේශ රැකියා සඳහා මැද පෙරදිගට පිටත්ව යන සෑම ශ්‍රී ලාංකික ශ්‍රමිකයෙකුම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වූ වහාම නොමිලයේ රක්ෂණ ආවරණයක් ලැබේ. එම රක්ෂණය තමාගේ සේවා ගිවිසුම් කාලයට පමණක් සීමාවේ. තමා අවුරුදු 2ක සේවා කාලයට පිටත්ව ගිය පසු එම කාලය තුල තමාට මුහුණදීමට සිදුවන හදිසි

අනතුරු, අතපය කැඩීම්, බිඳීම් යනාදිය සඳහා ඉහත සඳහන් රක්ෂණ ආවරණයෙන්. ප්‍රතිලාභ ලබා ගත හැකිය. ඒ සඳහා තමන් විදේශයේදීම තමාගේ ලංකාවේ සිටින ඥාතීන් දැනුවත් කොට ඒ ගැන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට පැමිණිලි කරන ලෙස දැනුම් දිය යුතුය. බොහෝ ශ්‍රමිකයින් තමාගේ හදිසි අනතුර පිළිබඳ දැනුම්දිය කරන්නේ වසර 2ක අවසන් වූ පසුයි. එවිට රක්ෂණයේ ප්‍රතිලාභ ලබාගත නොහැකිය වේ. එමනිසා තමන්ම ලංකාවට පැමිණ මෙම පැමිණිල්ල කලයුතු වන්නේ නැත. තමාගේ ඥාතීන්ට එම කාලය තුලදීම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය දැනුවත් කිරීමෙන් තමාගේ රක්ෂණ ආවරණය ලංකාවට කොපමණ කලකින් පැමිණියද ලබාගත හැකිය.

විදේශගත වූ තමාගේ ස්වාමියා,බිරිඳ, දරුවන් හදිසියකින් මියගිය විට එම තමාගේ ලේ ඥාතීන්ගේ යැපෙන්නන්ට ලබාගත හැකි වරප්‍රසාද වන්නේ ලේ වන්දියයි.(Blood money) එවැනි අවස්ථාවකදී ශ්‍රී ලංකාවේ පිහිටි විදේශ කටයුතු අමාත්‍යාංශයේ (කන්සියුලර්) අංශයට ගොස් පැමිණිලි කල යුතු අතර එහි ලිපිනය පහත දැක්වේ.

ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශය,<br>
කන්සියුලර් අංශය,<br>
අංක14, සර් බාරොන් ජයතිලක මාවත,<br>
කොළඹ 01.<br>
දුරකථන - 0114718972<br>
වෙබ් අඩවිය - www.comsular@sltnet.lk

එවිට කන්සියුලර් අංශය මගින් අදාල ලේ ඥාතීන්ට ලේඛණ 2ක් ලබාදෙයි. එම ලේඛන සම්පූර්ණ කොට එම අංශයට භාරදිය යුතුවේ. ඒවානම්

1) **<u>උරුමක්කාරභාවය පිළිබඳ සහතිකය</u>**

මෙම ලේඛණයට විදේශයේදී මියගිය පුද්ගලයාගේ උරුමකරුවන්ගේ විස්තර ඇතුලත් කොට නීතිඥවරයෙකු ලවා සහතික කරගත යුතුය.

2) **<u>විදේශීය තානාපතිට ඇටර්නි බලය ලබාදීම</u>**

මෙම ලියවිල්ල මගින් සිදුකරනුයේ තමාගේ මියගිය පුද්ගලයාගේ සියලු නීතිමය කටයුතු එම රටේදී සිදු කිරීමට අදාල රටේ තානාපතිට ශ්‍රී ලාංකික උරුමකරුවන් විසින් බලය දෙන ලියවිල්ලයි. එම ලියවිල්ලද නීතිඥවරයෙකු ලවා සහතික කරගත යුතුය. මෙම ලේඛණ දෙක සැකසු පසු එම ලේඛණ 2ක ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් ලවා සහතික කරගත යුතුවේ.

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සංඛ්‍යා ලේඛන වලට අනුව විවිධ මැදපෙරදිග හා අනෙකුත් රටවල් සඳහා පිටත්ව ගොස් ඇති ගෘහ සේවිකාවන්ගේ සංඛ්‍යාවන් මෙසේය.**

| රට | 2004 | 2005 | 2006 | 2007 | 2008 |
|---|---|---|---|---|---|
| සෞදි අරාබිය | 38.97% | 40.02% | 35.45% | 32.19% | 32.62% |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 9.64% | 10.93% | 13.02% | 13.23% | 12.20% |
| බහරේන් | 1.66% | 1.71% | 2.76% | 3.08% | 2.509% |
| ඕමාන් | 1.27% | 1.28% | 1.79% | 1.85% | 2.01% |

| | | | | | |
|---|---|---|---|---|---|
| කුවේට් | 23.94% | 22.80% | 27.31% | 31.39% | 32.82% |
| දෝහ කටාර් | 2.98% | 3.88% | 4.46% | 3.95% | 4.25% |
| ජෝර්දාන් | 2.81% | 3.87% | 4.83% | 3.83% | 5.68% |
| ලෙබනන් | 15.28% | 12.74% | 6.64% | 6.42% | 4.26% |
| සිංගප්පූරුව | 0.63% | 0.61% | 0.67% | 0.58% | 0.52% |
| මැලේසියාව | 0.19% | 0.19% | 0.24% | 0.29% | 0.34% |
| හොංකොං | 0.11% | 0.11% | 0.21% | 0.24% | 0.21% |
| සයිප්‍රස් | 2.30% | 1.55% | 2.18% | 2.55% | 2.09% |
| මාලදිවයින | 0.11% | 0.20% | 0.19% | 0.23% | 0.22% |
| ග්‍රීසිය | 0.02% | 0.01% | 0.01% | 0.04% | 0.05% |
| ඉතාලිය | - | 0.04% | - | - | - |
| පකිස්ථානය | 0.01% | - | 0.02% | 0.02% | 0.02% |
| සිරියාව | 0.02% | 0.01% | 0.02% | 0.01% | 0.01% |
| ඊජිප්තුව | 0.01% | 0.01% | 0.01% | 0.01% | 0.01% |
| ඊශ්‍රාලය | 0.01% | 0.02% | 0.12% | 0.06% | 0.11% |

මේ අනුව වැඩිවශයෙන් ගෘහසේවිකාවන් සංක්‍රමණය වී ඇත්තේ සෞදි අරාබිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, සහ කුවේට් යන රටවල් වලටය.

**ශ්‍රී ලංකා විදේශසේවා නියුක්ති කාර්යාංශය ලැබී ඇති පැමිණිලිවල වගුවක් පහත පරිදි වේ.**

| පැමිණිල්ලේ ස්වාභාවය | 2004 | 2005 | 2006 | 2007 |
|---|---|---|---|---|
| එකඟ වූ වැටුප් | 1626 | 1709 | 1989 | 1495 |
| සන්නිවේදනයේ අඩුකම | 2165 | 1755 | 2511 | 1686 |
| රෝගී වී හිරිහැර කිරීම(ශාරීරික හා | 610 | 653 | 662 | 672 |

| | | | | |
|---|---|---|---|---|
| ලිංගික) | | | | |
| මරණය (ස්වභාවික) | 153 | 115 | 172 | 199 |
| මරණය (මිනිමැරුම් නිසා) | 8 | 4 | 1 | 3 |
| මරණය (සියදිවි නසා ගැනීම) | 9 | 22 | 7 | 9 |
| මරණය (ලෙබනන් යුද්ධය නිසා) | - | - | 6 | - |
| කොන්ත්‍රාත්තුවෙන් පසු ආපසු නොඑවීම | 206 | 711 | 725 | 922 |
| ගමනාන්තයේදී භාර නොගැනීම නිසා අතරමංවීම | 13 | 35 | - | - |
| සිය රටේ ප්‍රශ්ණ | 343 | 516 | 522 | 36 |
| සේවා කොන්ත්‍රාත්තුව කඩ කිරීම | 1144 | 1792 | 1152 | 739 |
| රැකියාවක් නොමැතිව අතරමංවීම | 13 | 541 | 1060 | 484 |
| කල්පිරීමට කලින් අවසාන කිරීම | - | 01 | - | - |
| නීතිවිරෝධී මුදල් ගනුදෙනු | 81 | 1 | 1 | 5 |

ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාවට ඇතුලුවීම පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන වෙනත් පුරවැසියන් සහ තැනැත්තන් ශ්‍රී ලංකාවේ පිටවීම විධිමත් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන නොමනා තැනැත්තන් ශ්‍රී ලංකාවෙන් ඉවත්කිරීම සඳහා සහ ඉහත කී කරුණු වලට ආනුෂංගික හෝ සම්බන්ධ වෙනත් කරුණු සඳහා විධිවිධාන සැලසීම පිණිස වූ පනතක් ලෙස මෙය හැඳින්විය හැකිය. මේ සම්බන්ධව ප්‍රධාන පනත ලෙස 1955 අංක 16 දරණ ආගමන විගමන පණතත් ඊට අදාල සංශෝධන ලෙස 1993 අංක 16 සහ 2006 අංක 31 දරණ සංශෝධන පණත්ද දැක්විය හැකිය.

2006 අංක 31 දරණ ආගමන විගමන සංශෝධන පනත ආදී පනත් යටතේ ක්‍රියාත්මක වන්නාවූ ආගමන විගමන දෙපාර්තමේන්තුවද මෙම

සංක්‍රමණ ක්‍රියාවලියේදී සුවිශේෂි කාර්යභාරයක් ඉටු කරයි. එනම් විදේශගත ශ්‍රමිකයින් ගැන සාකච්ඡා කිරීමේදී ඔවුනට ඉතා වැදගත්වන්නාවූ ලේඛනයක් ලෙස ගුවන් ගමන් බලපත්‍රය දැක්විය හැකිය. මෙම ගුවන් ගමන් බලපත්‍රයද බොහෝ දුරට ව්‍යාජ රැකියා ඒජන්තකරුවන් විසින් බලෙන් තබාගෙන අදාල පුද්ගලයාට ලබා නොදෙයි. මෙවැනි අවස්ථාවකදී ආගමන විගමන පනත ප්‍රකාරව අදාල පුද්ගලයාගේ කැමැත්තෙන් තොරව ගුවන්ගමන් බලපත්‍රය තබාගෙන සිටීම වරදකි.එවැනි අවස්ථාවකදී ඔබගේ ගුවන් ගමන් බලප්‍රයේ අංකය සහිතව ලිඛිතව ආගමන විගමන දෙපාර්තමේන්තුවේ පාලකතුමාට (Controller)පැමිණිල්ලක් කල යුතුය. එය රෙජිස්ටර් තැපැල් මගින් හෝ ආගමන විගමන දෙපාර්තමේන්තුව වෙත පිවිසීමෙන් ද සිදු කල හැකිය.

එවිට ඔවුන් විසින් අදාල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ගුවන් ගමන් බලපත්‍රය ලබා ගැනීමට අවශ්‍ය නීතිමය කටයුතු කරනු ලැබේ.

**ආගමන විගමන දෙපාර්තමේන්තුවේ ලිපිනය**

පාලකතුමා,

අංක 10,

ආගමන විගමන දෙපාර්තමේන්තුව,

ආනන්ද රාජකරුණා මාවත,

කොළඹ 10.

දුරකථනය - 0115 -329000

වෙබ් අඩවිය - www.imigration.gov.lk

**ඔබ මැදපෙරදිග රටක ගෘහ සේවයට හෝ වෙනත් රැකියාවකට යාමට බලාපොරොත්තු වන්නේ නම් දැනගත යුතු මූලික කරුණු**

1. ලියාපදිංචි ඒජන්සියක් මාර්ගයෙන් යන්නේ නම් - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි ආයතනයක් විය යුතුය.
2. ලියාපදංචි නොවු ආයතන හෙවත් පොදු භාවිතයේ කියවෙන Sub Agency මගින් ඔබගේ මැදපෙරදිග ගමන ආරම්භ නොකල යුතුය.
3. ඔබගේ රැකියාවේ විස්තර ඇතුලත්ව සකසන ලද සේවා ගිවිසුම (Service Agreement) අත්සන් කොට එහි පිටපතක් අනිවාර්යයෙන් ඔබ ළඟ තබා ගත යුතුය.
4. ඔබ රැකියාව සඳහා පිටත්ව යන රටෙහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ දුරකථන අංකය,ලිපිනය, තමා ළඟ තබා ගත යුතුය.
5. ඔබ දරුවන් සිටින මවක් නම් පිටරට යෑමට පෙර එම දරුවන්ගේ ආරක්ෂාව භාරකාරත්වය පිළිබඳව තීරණය කොට ඊට අදාල නිසි පියවර ගත යුතුය.
6. ඔබට නීතිමය ගැටළු උද්ගත වුවහොත් ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ ලිපිනය - ''අංක 129, මහධිකරණ සංකීර්ණය,අළුත්කඩේ, කොළඹ 12.''
7. ඔබට විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය නම් දැනුම් දෙන්න. ''අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල.''

ඔබ දිවයිනේ කොතැනක සිටියද මේ සම්බන්ධයේන් අපගේ පහත සඳහන් නීති ආධාර කොමිෂන් සභාවේ ප්‍රාදේශීය මධ්‍යස්ථාන වෙත ගොස් ඔබගේ ගැටළු සඳහා නොමිලේ නීතිමය විසඳුම් ලබාගත හැකිය.

**නීති ආධාර කොමිෂන් සභාවේ සහය ලබාගත හැක්කේ කෙසේද?**

විදේශගතවීමට පෙර විදේශගතවූවායින් පසු හා නැවත ලංකාවට පැමිණි පසු යන අවස්ථා 3දීම ඔබට නොමිලයේ නීති උපදෙස් හා අදාල වන්නාවු ආයතනයන්ට යොමු කොට ඔබගේ ගැටළුව නිරාකරණය කරදීමට අප සැම නීති සහය ලබාදෙන්නෙමු.

**එම කාර්යයන් ඔබගේ දැනගැනීම පිණිස පහතින් දක්වා තිබේ.**

1. නීත්‍යානුකූල ඒජන්සියක් හරහා ඔබ විදේශගතවන්නේද නැද්ද යන වග
2. වලංගු ගුවන් ගමන් බලපත්‍රයක් මගින් ඔබ විදේශගතවනවාද නැද්ද යනවග
3. වලංගු විදේශ බලපත්‍රයක් මගින් ඔබ විදේශගතවාද නැද්ද යනවග
4. නීත්‍යානුකූල සේවා ගිවිසුමක් අත්සන් කිරීම අනිවාර්‍යය බව තමා ඒජන්තවරයා සමග මුදල් ගණුදෙනු කරන්නේ නම් ඒ සඳහා වලංගු රිසිට්පත් ලබාගතයුතු බව යනාදි විදේශගතවීමට පෙර අවශ්‍යය වන්නා වූ පෙර සූදානම පිළිබඳ සියලු නීති උපදේශන සේවාවන් ලබාගත හැකිය.

## ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ ප්‍රාදේශීය මධ්‍යස්ථාන ලිපිනයක් සහ දුරකථන අංක

| *මධ්‍යස්ථානය* | *ලිපිනය* |
|---|---|
| 1. ප්‍රධාන කාර්යාලය | මහාධිකරණ සංකීර්ණය,<br>අළුත් කඩේ, කොළඹ 12.<br>011-2433618, 011-5835329 |
| 2. කොළඹ මධ්‍යස්ථානය | 211, උපරිමාධිකරණ<br>සංකීර්ණය, අළුත්කඩේ,<br>කොළඹ 12.<br>011-313 7153 |
| 3. වැලිකඩ බන්ධනාගාරය | වැලිකඩ බන්ධනාගාරය,<br>වැලිකඩ .<br>011-5335329 |
| 4. අනුරාධපුර | උසාවි සංකීර්ණය,<br>අනුරාධපුරය<br>025-2224465 |
| 5. මහනුවර | නව උසාවි සංකීර්ණය,<br>දෙවන මහල, නුවර.<br>081-2388978 |
| 6. ගාල්ල | අධිකරණ සංකීර්ණය,<br>කොටුව,ගාල්ල.<br>091-2226124 |
| 7. හම්බන්තොට | උසාවි සංකීර්ණය, තිස්ස පාර,<br>හම්බන්තොට,<br>047-2221092 |
| 8. නුවරඑළිය | උසාවි සංකීර්ණය, නුවර එළිය.<br>052-2235260 |

| | |
|---|---|
| 9. මොණරාගල | උසාවි සංකීර්ණය,මොණරාගල,<br>055-2276891 |
| 10. අම්පාර | උසාවි සංකීර්ණය,අම්පාර.<br>063-2223496 |
| 11.කෑගල්ල | උසාවි සංකීර්ණය,කෑගල්ල.<br>035-2231790 |
| 12.හලාවත | උසාවි සංකීර්ණය,හලාවත<br>032-2222175 |
| 13.අක්කරෙපත්තු | අධිකරණ සංකීර්ණය,<br>අක්කරෙපත්තු<br>067-2279462 |
| 14.බලපිටිය | උසාවි සංකීර්ණය, බලපිටිය.<br>091-2255753 |
| 15.මාතර | උසාවි සංකීර්ණය. මාතර.<br>041-2233815 |
| 16.වව්නියාව | උසාවි සංකීර්ණය, වව්නියාව.<br>024-2221863 |
| 17.ත්‍රිකුණාමලය | උසාවි සංකීර්ණය, ත්‍රිකුණාමලය<br>026-2226328 |
| 18.කල්මුණේ | අධිකරණ සංකීර්ණය, කල්මුණේ<br>067-2223710 |
| 19.යාපනය | අධිකරණ සංකීර්ණය, යාපනය.<br>021-2224545 |
| 20.මඩකලපුව | පළමුවන මහල,උසාවි<br>සංකීර්ණය,මඩකලපුව.<br>065-2225399 |

| | |
|---|---|
| 21.බණ්ඩාරවෙල | 15,වැලිමඩ පාර,බණ්ඩාරවෙල.<br>057-2224733 |
| 22.මාතලේ | උසාවි සංකීර්ණය, මාතලේ.<br>066-2224828 |
| 23.අවිස්සවේල්ල | උසාවි සංකීර්ණය,අවිස්සාවෙල්ල.<br>036-2233857 |
| 24.රත්නපුර | උසාවි සංකීර්ණය, රත්නපුර.<br>045-2226899 |
| 25.මීගමුව | උසාවි සංකීර්ණය, මීගමුව<br>031-2222779 |
| 26.කළුතර | අධිකරණ සංකීර්ණය, කළුතර<br>034-2222017 |
| 27.ගම්පහ | අධිකරණ සංකීර්ණය,ගම්පහ.<br>033-2248804 |
| 28.පොලොන්නරුව | උසාවි සංකීර්ණය,පොළොන්නරුව.<br>027-2226572 |
| 29.පානදුර | දිසා අධිකරණ සංකීර්ණය,පානදුර.<br>038-2244822 |
| 30.කුලියාපිටිය | උසාවි සංකීර්ණය,පන්නල පාර,<br>කුලියාපිටිය.<br>037-2284611 |
| 31.කුරුණෑගල | උසාවි සංකීර්ණය,කුරුණෑගල.<br>037-2229641 |
| 32.මහියංගනය | උසාවි සංකීර්ණය,බදුල්ල පාර,<br>මහියංගනය.<br>055-2258332 |

33.මහව

උසාවි සංකීර්ණය,මහව.
037-2275075

34.හොරණ

නව උසාවි සංකීර්ණය,හොරණ
034-2265244

35.මතුගම

උසාවි සංකීර්ණය,මතුගම
034-2249262

36.අත්තනගල්ල

උසාවි
සංකීර්ණය,මල්වත්ත,නිට්ටඹුව.
033-2297020

37.දෙනියාය

උසාවි සංකීර්ණය,
මොරවක,ගල්දොල,කොටපොල.
041-3428006

38.දඹුල්ල

අධිකරණ සංකීර්ණය,
දඹුල්ල.
066-2284551

39.මාවනැල්ල

71/5J 1/1,
හයිවේ සංකීර්ණය,නුවර
පාර,මාවනැල්ල.
035-2247272

40.මාරවිල

අධිකරණ සංකීර්ණය,
මාරවිල.
032-2254443

41.වරකාපොල

උසාවි සංකීර්ණය,
තුලිහිරියඅලව්ව.
037-2277075

42.ළමා අධිකරණය

ළමා අධිකරණ සංකීර්ණය,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
කොස්වත්ත, බත්තරමුල්ල

| | |
|---|---|
| 43.නුගේගොඩ | උසාවිසංකීර්ණය,<br>ගංගොඩවිල,නුගේගොඩ<br>011-280906800 |
| 44.වැලිමඩ | 33,බොරලන්ද පාර, වැලිමඩ.<br>0572244860 |
| 45.කන්තලේ | අධිකරණ සංකීර්ණය,කන්තලේ.<br>026-2234521 |
| 46.තඹුත්තේගම | අධිකරණ සංකීර්ණය,<br>තඹුත්තේගම.<br>025-2276259 |
| 47.ගල්කිස්ස | උසාවි සංකීර්ණය,ගල්කිස්ස.<br>011-2718708 |
| 48.තිස්සමහාරාමය | උසාවි සංකීර්ණය,<br>තිස්සමහාරාමය<br>047-2239611 |
| 49.බද්දේගම | අධිකරණ සංකීර්ණය,බද්දේගම.<br>091-2292051 |
| 50.වැල්ලවාය | දිසා අධිකරණ සංකීර්ණය,<br>වැල්ලවාය.<br>055-2274466 |
| 51.වළස්මුල්ල | උසාවි සංකීර්ණය,<br>වළස්මුල්ල.<br>047-2245566 |
| 52.නාවලපිටිය | උසාවි සංකීර්ණය.<br>නාවලපිටිය.<br>054-2224227 |

| | |
|---|---|
| 53.ඇඹිලිපිටිය | අධිකරණ සංකීර්ණය,<br>ඇඹිලිපිටිය.<br>047-2230299 |
| 54.හැටන් | 204 ඩී.කොළඹ පාර,<br>ෆ්‍රැට්හිල්,හැටන්.<br>051-2225238 |
| 55.හිඟුරක්ගොඩ | නො.278,නුවරවත්ත,<br>හිඟුරක්ගොඩ.<br>027-5676729 |
| 56.බදුල්ල | අධිකරණ සංකීර්ණය,<br>බදුල්ල.<br>055-2225759 |
| 57.මන්නාරම | උසාවි සංකීර්ණය,<br>මන්නාරම<br>023-2222045 |
| 58.කඩුවෙල | උසාවි සංකීර්ණය,<br>කඩුවෙල.<br>011-2548150 |
| 59.මුලතිව් | උසාවි සංකීර්ණය,<br>මුලතිව්<br>021-2290072 |
| 60.කිලිනොච්චි | අධිකරණ සංකීර්ණය,<br>කිලිනොච්චි<br>021-2285618 |
| 61.මුතූර් | උසාවි සංකීර්ණය,<br>මුතූර්.<br>026-2238777 |

| | |
|---|---|
| 62.වාලච්චේන | උසාවි සංකීර්ණය,<br>වාලච්චේන.<br>065-2258349 |
| 63.බත්තරමුල්ල | උසාවි සංකීර්ණය,<br>බත්තරමුල්ල<br>011-2877687 |
| 64. කඩුවෙල | උසාවි සංකීර්ණය,<br>කඩුවෙල<br>011-2548150 |
| 65. කොටපොල | උසාවි සංකීර්ණය,<br>කොටපොල<br>041-2271128 |
| 66. තංගල්ල | උසාවි සංකීර්ණය,<br>තංගල්ල<br>047-2240122 |
| 67. අලව්ව | උසාවි සංකීර්ණය,<br>අලව්ව<br>037-2277075 |
| 68. බලන්ගොඩ | උසාවි සංකීර්ණය,<br>බලන්ගොඩ.<br>045-2289099 |
| 69. චාවකච්චේරිය | උසාවි සංකීර්ණය,<br>චාවකච්චේරිය |
| 70. කැකිරාව | උසාවි සංකීර්ණය,<br>කැකිරාව.<br>025-2263536 |
| 71. පේදුරුතුඩුව | උසාවි සංකීර්ණය,<br>පේදුරුතුඩුව |

| | |
|---|---|
| 72. පොතුවිල් | උසාවි සංකීර්ණය,<br>පොතුවිල් |
| 73. වාරියපොල | උසාවි සංකීර්ණය,<br>වාරියපොල<br>037-2268199 |
| 74. කඩවත | උසාවි සංකීර්ණය,<br>කඩවත.<br>011-2922440 |
| 75. පොල්ගහවෙල | උසාවි සංකීර්ණය,<br>පොල්ගහවෙල.<br>037-2243039 |
| 76.ගල්ගමුව | උසාවි සංකීර්ණය,<br>ගල්ගමුව.<br>037-2253290 |
| 77. පූගොඩ | උසාවි සංකීර්ණය,<br>පූගොඩ<br>011-2405333 |
| 78. කැබිතිගොල්ලෑව | උසාවි සංකීර්ණය,<br>කැබිතිගොල්ලෑව<br>025-2298101 |
| 79. හෝමාගම | උසාවි සංකීර්ණය,<br>හෝමාගම<br>072-8804400 |
| 80.දෙයියන්දර | උසාවි සංකීර්ණය,<br>දෙයියන්දර<br>041-2268077 |

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව
අංක 129, උසාවි සංකීර්ණය,
කොළඹ - 12.